# මාතලේ දුම්රිය මාර්ගය ආශ්‍රිත කාර්මික උරුමය

**ජයසිංහ ජේ.එල්.ජී.වී.එම්.එස්.එස්.**[1]

බ්‍රිතාන්‍යය පාලන සමය තුළ කෝපි වගා කටයුතු මාතලේ ආශ්‍රිත ප්‍රදේශවල සිදුකිරීමත් සමඟ මාතලේ ප්‍රදේශයේ සිටි වැවිලිකරුවන්හට දුම්රිය මාර්ගයක අවශ්‍යතාවය තදින් දැනෙන්නට විය. ජේම්ස් ලෝඩ්න් ආණ්ඩුකාරවරයාගේ සමයේ මාතලේ දුම්රිය මාර්ගයේ වැඩකටයුතු ආරම්භ කරන ලද අතර ක්‍රි.ව. 1880 වන විට එහි වැඩකටයුතු අවසන් විය. ඩේවිඩ් රීඩ් සහ සමාගම විසින් මාතලේ දුම්රිය මාර්ගය ගොඩනංවන ලැබූ බවත්, එය අදියර තුනක් යටතේ සිදු වූ බවත් සඳහන් වේ. පේරාදෙණිය හන්දිය සිට මහනුවර හරහා මාතලේ දක්වා ඉදිවුණු මෙම දුම්රිය මාර්ගය ආශ්‍රිත ව බ්‍රිතාන්‍යයන් විසින් සිවිල් ඉංජිනේරුමය හා යාන්ත්‍රික තාක්ෂණික උරුමයන් රැසක් ගොඩනංවනු ලැබූ අතර එම කාර්මික උරුමයන් අනාවරණය කර ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් දත්ත එක්රැස් කරගැනීමේ දී පූර්ව පර්යේෂණ සඳහා අවධානය යොමුකරමින් පුස්තකාල අධ්‍යයන, ලේඛනාගාර පරිශීලනය හා සිතියම් අධ්‍යයන සිදු කළ අතර පසුව ක්ෂේත්‍රය ගවේෂණය කරමින් නිරීක්ෂණය කිරීම හා සම්මුඛ සාකච්ඡා සිදුකරන ලදී. පේරාදෙණිය, සරසවි උයන, මහනුවර, මහයියාව, කටුගස්තොට, උඩතලවින්න, වත්තේගම, උකුවෙල හා මාතලේ ලෙස මෙම දුම්රිය මාර්ගයේ ප්‍රධාන දුම්රිය ස්ථාන බ්‍රිතාන්‍යය යුගය තුළ ඉදි වූ බවත් ඒ ආශ්‍රිත ව පැරණි දුම්රිය ස්ථාන, පැරණි ගබඩා ගොඩනැගිලි, සංඥා කුළුණු, පැරණි බංගලා නිවාස, වෙඩි බෙහෙත් ගබඩා, දුම්රිය ධාවනාගාර, ජල ස්ථම්භ, වාත්තු යකඩින් කළ ජල බේසම්, දුම්රිය හැරවුම් පීඨිකා, පැරණි දොඹකර, පැරණි තරාදි, පැරණි පහන් කණු, ටෙලිග්‍රාෆ් කණු, ඔරලෝසු, පැරණි දුරකථන, සංඥා ලාම්පු, පැරණි පුටු, මුදල් සේප්පු, ප්‍රවේශ පත්‍ර සඳහා දින සටහන් තබන යන්ත්‍ර, ඇඟිලි සලකුණු මුද්‍රණ යන්ත්‍ර, ගල් අඟුරු දාහක උඳුන්, ටැබ්ලට් උපකරණ, සැමපෝ සංඥා කුළුණු, දුම්රිය ගේට්ටු, වාත්තු යකඩින් කළ සැරසිලි, මඟී ගුවන් පාලම් හා පැරණි දුම්රිය එන්ජින් දක්නට ලැබේ. මීට අමතර ව මාතලේ දුම්රිය මාර්ගයෙහි ගඩොලින් තනන ලද ආරුක්කුමය බෝක්කු, යකඩ ග්‍රේඩර් පාලම් හා බිම්ගෙවල් ද වේ. අතීතයේ දී වතු වගා අස්වනු, පොහොර, උපකරණ හා වතුවලට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබන ස්ථාන, දුම්රිය එන්ජින් නඩත්තුව, ගාල් කර තැබීම හා එන්ජින් සඳහා ජල පහසුකම් සපයන දුම්රිය ස්ථාන මාතලේ මාර්ගයේ වූ බව දක්නට ලැබේ. වර්තමානයේ දී මෙම දුම්රිය මාර්ගයේ පවතින ඉදිකිරීම් විනාශවෙමින් පවතින අතර එම කාර්මික උරුම රැකගැනීම යුතුකමක් වන්නේ ය.

**ප්‍රමුඛ පද :** කාර්මික උරුම, මාතලේ දුම්රිය මාර්ගය, බ්‍රිතාන්‍යය යුගය, කෝපි වගාව, ජල ස්ථම්භ

[1]පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. vishwasrijayasinghe@gmail.com